# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2198/6 – 2020 ඔක්තෝබර් 19 වැනි සඳුදා – 2020.10.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/02/N/2014/182.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

ආර්. එම්. පී. නිහාල් රාජපක්ෂ මයා., නො. 44, ලක්මල් පෙදෙස, කලල්පිටිය, පස්යාල.

සහ

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, නො. 200, කිරුළ පාර, කොළඹ 05.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, හෝකන්දර උතුර, අරංගල, රණමයුර මාවත, නො. 453/F, වී. ජයරත්න මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**නිමල් සිරිපාල ද සිල්වා,**
කම්කරු අමාත්‍ය.

2020 ඔක්තෝබර් මස 13 වැනි දින,
කොළඹ දී ය.

1A – G 33120 – 36 (2020/10)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය: IR/COM/02/N/2014/182.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

ආර්. එම්. පී. නිහාල් රාජපක්ෂ මයා., නො. 44, ලක්මල් පෙදෙස, කලල්පිටිය, පස්යාල.

සහ

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, නො. 200, කිරුළ පාර, කොළඹ 05.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,

"ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ෆෝමන්වරයෙකු ලෙස සේවය කළ ආර්. එම්. පී. නිහාල් රාජපක්ෂ මහතාට එදිරිව 2013 වර්ෂයේ අත්තනගල්ල මහේස්ත්‍රාත් අධිකරණයේ පැවති අංක 74664/PC දරන නඩුවෙන් ඔහු නිදොස්කොට නිදහස් කර තිබුණ ද ඊට පෙර එම කරුණ මත 2005.06.10 දින වැඩ තහනම් කර විනය පරීක්ෂණයකින් අනතුරුව සේවය අවසන් කර තිබීම මඟින් ඔහුට අසාධාරණයක් සිදුව තිබේද? යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔහුට හිමිවිය යුතු සහනයන් කවරේ ද යන්නත් පිළිබඳව වේ."

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2020 ඔක්තෝබර් මස 09 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

11 – 15

---

මගේ අංකය: IR/COM/04/2019/212.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

එම්. බී. එම්. ආරියචන්ද්‍ර මයා., දෙවන පටුමග, කොළඹගේවත්ත, තිරාණගම.

සහ

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, නො. 200, කිරුළ පාර, කොළඹ 05.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, මාතර, පඹුරණ, අබේගුණරත්න මාවත, නො. 10/A, ඒ. ඒ. වීරසූරි මයා. පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

නිමල් සිරිපාල ද සිල්වා,
කම්කරු අමාත්‍ය.

2020 ඔක්තෝබර් මස 13 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/04/2019/212.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

එම්. බී. එම්. ආරියචන්ද්‍ර මයා., දෙවන පටුමග, කොළඹගේවත්ත, තිරාණගම.

සහ

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, නො. 200, කිරුළ පාර, කොළඹ 05.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

''රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අනුව වයස අවුරුදු 60 දක්වා සේවය කිරීමට අවස්ථාව ලබානොදී විශ්‍රාම ගැන්වීමෙන්, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ගිංතොට ප්‍රාදේශීය වැඩපලේ සේවක එම්. බී. එම්. ආරියචන්ද්‍ර මහතාට අසාධාරණයක් සිදුවී තිබේද? අසාධාරණයක් සිදුව ඇත්නම් හිමිවිය යුතු සහන කවරේ ද'' යන්න පිළිබඳව වේ.

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2020 ඔක්තෝබර් මස 13 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

11 – 06

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.